3477

සියලු ම හිමිකම් ඇවිරිණි
முழுப் பதிப்புரிமையுடையது
All Rights Reserved

බස්නාහිර පළාත් අධ්‍යාපන දෙපාර්තමේන්තුව
மேல் மாகாணக் கல்வித் திணைக்களம்
Department of Education - Western Province

වර්ෂ අවසාන ඇගයීම
ஆண்டிறுதி மதிப்பீடு - 2015
Year End Evaluation

| | | | |
|---|---|---|---|
| ශ්‍රේණිය / தரம் / Grade: 07 | විෂයය / பாடம் / Subject: නර්තනය (දේශීය) | පත්‍රය / வினாத்தாள் / Paper: I, II | කාලය / காலம் / Time: පැය $1\frac{1}{2}$ |

නම :- .................................................................. විභාග අංකය :- ..............................

සැලකිය යුතුයි:

- දී ඇති උපදෙස් හොඳින් කියවන්න.
- අංක 01 සිට 15 දක්වා ප්‍රශ්න සියල්ලට ම පිළිතුරු සැපයිය යුතු ය. 16 - 20 දක්වා ප්‍රශ්න තෝරා ගත යුත්තේ ඔබ ඉගෙන ගන්නා නර්තන සම්ප්‍රදායට අයත් කොටසෙනි.
  උදා: ඔබ ඉගෙන ගන්නේ උඩරට නර්තන සම්ප්‍රදාය නම් පිළිතුරු ලිවිය යුත්තේ එම කොටසට අයත් අංක 16-20 දක්වා ප්‍රශ්න සඳහා පමණි.

## I කොටස

- අංක 01 සිට 05 දක්වා දී ඇති ප්‍රකාශ හරිනම් (✓) ලකුණ ද වැරදි නම් (✗) ලකුණ ද වරහන් තුළ යොදන්න.

(01) පොදු අවකාශයේ දී සැමදෙනා ම අන්‍යෝන්‍ය වශයෙන් සහයෝගයෙන් කටයුතු කළ යුතු වේ. ( )

(02) ඔබ ඉගෙන ගන්නා සරඹ පද / මාත්‍රා පද ඇසුරු කර ගැනීමෙන් නර්තන නිර්මාණය කළ නොහැකි ය. ( )

(03) ප්‍රායෝගිකව ගායනය. වාදනය සිදු කරන අයුරු ලියා දැක්වීම ප්‍රස්තාර කිරීමයි. ( )

(04) ජන ජීවිතයේ විවිධ ක්‍රියාකාරකම් ඇසුරු කර ගනිමින් ගැමි කවි නිර්මාණය වී ඇත. ( )

(05) සාමූහිකත්වය හා සමගිය පිළිබිඹු වන උත්සවයක් ලෙස සිංහල හා හින්දු අවුරුදු උත්සවය හැඳින්විය නොහැකි ය. ( )

- A කොටසට ගැළපෙන නිවැරදි පිළිතුර B කොටසින් තෝරා යා කරන්න.

| | A | B |
|---|---|---|
| (06) | කාන්තාවන්ට ආවේණික ලාස්‍ය නර්තන අංගයකි. | තුනකි. |
| (07) | අවකාශ භාවිතයේ ප්‍රධාන අංග | ප්‍රකාශනයයි. |
| (08) | කිතුල්, දැව රංග උපකරණයක් ලෙස භාවිත කරන ගැමි නැටුමකි. | කළගෙඩි |
| (09) | චරිත නිරූපණය සඳහා වැදගත් වන්නේ | දෙකකි. |
| (10) | තනි තිතේ ප්‍රභේද | ලී කෙළි |

(1 × 10 = 10)

◆ නිවැරදි පිළිතුර වරහන තුළින් තෝරා හිස්තැන් පුරවන්න.

(11) ............................................... සමූහ වාදනයක දී යොදා ගත හැකි ආදේශ භාණ්ඩයකි.
(තම්මැට්ටම , දවුල , ටින් බෙරය)

(12) "උඩ යන තරමට පපුවයි දන්නේ" ....................................... ගායනා සඳහා යොදා ගනී.
(ගොයම් , ඔන්චිලිවාරම් , කළගෙඩි)

(13) ප්‍රධාන ආගමික, සංස්කෘතික අංගයන් දැක්වෙන උත්සවයක් ලෙස ....................................... හැඳින්විය හැකි ය. (ක්‍රීඩා උත්සවය, ඇසළ උත්සවය, නිදහස් උත්සවය)

(14) ශාන්තිකර්මයන්හි ඇතුළත් අනාසාතාත්මක කවි විශේෂයකි. .......................................
(ආශිර්වාද කවි, වන්නම් කවි, සරල කවි)

(15) කෘෂිකාර්මික පරිසරය ඇසුරින් නිර්මාණය වූ ....................................... නැටුම සඳහා රන් තෙලඹු වර්ණනාවේ කවි භාවිතා කරයි. (කළගෙඩි , ලී කෙළි , කුළු)

(1 × 5 = 5)

◆ ඔබ ඉගෙන ගන්නා නර්තන සම්ප්‍රදාය තෝරාගෙන පිළිතුරු සපයන්න.

◆ අංක 16 සිට 20 දක්වා ප්‍රශ්නවලට පිළිතුරු වරණ අතුරෙන් තෝරා යටින් ඉරක් අඳින්න.

උඩරට නර්තන සම්ප්‍රදාය

(16) උඩරට නර්තන සම්ප්‍රදායේ පාද හුරු කරගැනීමේ මූලික අභ්‍යාස මේ නමින් හැඳින්වේ.
(1) අත් සරඹ (2) පා සරඹ (3) ගොඩ සරඹ (4) ඉලංගම් සරඹ

(17) ගොඩ සරඹ අවසානයේ
(1) සීරුමාරුව නටනු ලබයි. (2) කස්තිරම නටනු ලබයි.
(3) හමාර පදය නටනු ලබයි. (4) අඩව්ව නටනු ලබයි.

(18) "ගත් ගත් පයත් අසුගෙ....." යන කවියේ ඊළඟ කවි පද කොටස වනුයේ,
(1) වෙන් වෙන් එකත් පසුව ............ ය. (2) ලත් ලත් සිදත් කුමරු ............ ය.
(3) ශබ්දත් වසත් සුරිඳු ............ ය. (4) ගත් සිත් තොසත් පැව්දි ............ ය.

(19) උඩරට නර්තන වැඩි වශයෙන් දැකිය හැකි පෙරහැරකි.
(1) කතරගම ඇසළ පෙරහැර (2) කැලණියේ දුරුතු පෙරහැර
(3) මහනුවර දළදා පෙරහැර (4) සබරගමු සමන් දේවාල පෙරහැර

(20) "දොං ජිංත ගත දොංත" යන බෙර පදය වාදනය කළ හැකි වනුයේ,
(1) මාත්‍රා 2 + 3 දෙතිතේ තාල රූපයට ය. (2) මාත්‍රා 3 + 3 තනිතිතේ තාල රූපයට ය.
(3) මාත්‍රා 4 + 4 තනිතිතේ තාල රූපයට ය. (4) මාත්‍රා 2 + 2 තනිතිතේ තාල රූපයට ය.

(1 × 5 = 5)

## පහතරට නර්තන සම්ප්‍රදාය

(16) පහතරට නර්තන සම්ප්‍රදායේ පාද හුරු කරගැනීමේ මූලික අභ්‍යාස මේ නමින් හැඳින්වේ.

(1) අත් සරඹ (2) පා සරඹ (3) ඉලංගම් සරඹ (4) නමස්කාරය

(17) ඉලංගම් සරඹ අවසානයේ

(1) සීරුමාරුව නටනු ලබයි. (2) ඉරට්ටිය නටනු ලැබේ.

(3) හමාර පදය නටනු ලබයි. (4) අඩව්ව නටනු ලබයි.

(18) "නැගී තුරඟ වාහනය ....." යන කවියේ ඊළඟ කවි පද කොටස වනුයේ,

(1) තඹ පැහැය බබළමින් ............ ය. (2) පෙර දිගින් හිරු දෙවිඳු ............ ය.

(3) තුරු ඉඹුල් සෙවනතින් ............ ය. (4) මිණි ඔටුණු හිස දරා ............ ය.

(19) පහතරට නර්තන වැඩි වශයෙන් දැකිය හැකි පෙරහැරකි,

(1) මහනුවර දළදා පෙරහැර (2) කතරගම දුරුතු පෙරහැර

(3) කතරගම ඇසළ පෙරහැර (4) සබරගමු සමන් දේවාල පෙරහැර

(20) "ගුං දෙගත ගත්ත ගුං" යන බෙර පදය වාදනය කළ හැකි වනුයේ,

(1) මාත්‍රා 2 + 3 දෙතිතේ තාල රූපයට ය. (2) මාත්‍රා 3 + 3 තනිතිතේ තාල රූපයට ය.

(3) මාත්‍රා 4 + 4 තනිතිතේ තාල රූපයට ය. (4) මාත්‍රා 4 + 4 තනිතිතේ තාල රූපයට ය.

(1 × 5 = 5)

## සබරගමු නර්තන සම්ප්‍රදාය

(16) සබරගමු නර්තන සම්ප්‍රදායේ පාද හුරු කරගැනීමේ මූලික අභ්‍යාස මේ නමින් හැඳින්වේ.

(1) අත් සරඹ (2) මණ්ඩිපද (3) මාත්‍රා පද (4) නමස්කාරය

(17) පිට මාත්‍රා පදයක් අවසානයේ

(1) සීරුමාරුව නටනු ලබයි. (2) කලාසම නටනු ලැබේ.

(3) හමාර පදය නටනු ලබයි. (4) අඩව්ව නටනු ලබයි.

(18) "රොත්තෙන් මහත් සෙනඟ ....." යන කවියේ ඊළඟ කවි පද කොටස වනුයේ,

(1) ගත්තෙන් රැඟුම් කරන ............ ය. (2) ඇත්තෙන් කියන් පිරිවරා ............ ය.

(3) සිත් මෙන් බැලුම් කරන ............ ය. (4) එසඳ සහ සිරි වසන ............ ය.

(19) සබරගමු නර්තන වැඩි වශයෙන් දැකිය හැකි පෙරහැරකි.

(1) මහනුවර දළදා පෙරහැර (2) කැලණියේ දුරුතු පෙරහැර

(3) සබරගමු සමන් දේවාල පෙරහැර (4) කතරගම ඇසළ පෙරහැර

(20) "ජිං ජිමිත තත් තකට" යන බෙර පදය වාදනය කළ හැකි වනුයේ,

(1) මාත්‍රා 2 + 3 දෙතිතේ තාල රූපයට ය. (2) මාත්‍රා 3 + 3 තනිතිතේ තාල රූපයට ය.

(3) මාත්‍රා 4 + 4 තනිතිතේ තාල රූපයට ය. (4) මාත්‍රා 2 + 2 තනිතිතේ තාල රූපයට ය.

(1 × 5 = 5)

## II කොටස

- පළමු ප්‍රශ්නය අනිවාර්ය වේ.
- පළමු ප්‍රශ්නය ඇතුළුව ප්‍රශ්න තුනකට පමණක් පිළිතුරු සපයන්න.
- පිළිතුරු ලිවිය යුතු සියළු ප්‍රශ්න සංඛ්‍යාව තුනකි.

(01) "උසස් කලාකෘති නැරඹීම තුළින් රසවින්දනය ලැබේ"

(1) රූපවාහිනියේ ඔබ දුටු නර්තන අවස්ථා ඉදිරිපත් කරන වැඩසටහන් දෙකක් නම් කරන්න. (ලකුණු 02)

(2) ඉන් එක් වැඩ සටහනක
(i) නර්තන
(ii) ගායන
(iii) වාදන
(iv) රංග වස්ත්‍රාභරණ පිළිබඳව විස්තරයක් කරන්න. (ලකුණු 08)

(02) "දේශීය නර්තන සම්ප්‍රදායයන් අපගේ සංස්කෘතිය මැනවින් විදහා දක්වයි."
පහත කොටුවේ ඇති වචන උපයෝගී කරගෙන රුක් සටහන සම්පූර්ණ කරන්න.

දේශීය නර්තන සම්ප්‍රදායයන්

| | | |
|---|---|---|
| උඩරට නර්තන සම්ප්‍රදාය | (i) .................................. | සබරගමු නර්තන සම්ප්‍රදාය |
| (ii) .................................. | යක් බෙරය | (iii) .................................. |
| සත්කෝරලය | (iv) .................................. | රත්නපුරය |
| (v) .................................. | (vi) .................................. | පහන්මඩුව |
| (vii) .................................. | හිස රුදාව සුව කිරීම | (viii) .................................. |
| (ix) .................................. | (x) .................................. | පත්තිනි දෙවියන් |

දෙවොල් දෙවියන්, හම්බන්තොට, දෙවොල් මඩුව, කොහොඹා දෙවියන්, හිස රුදාව සුව කිරීම, දවුල, කොහොඹා කංකාරිය, පහතරට නර්තන සම්ප්‍රදාය, ගැටබෙරය, බලන්ගොඩ, වාහල දෙවියන්, ගම්මඩුව, දිවි දෝෂය සුව කිරීමට

(ලකුණු 10)

(03) (1) මාත්‍රා 3 තනි තිතට අයත් රබන් පදයක් ලියන්න. (ලකුණු 02)
(2) මාත්‍රා 2 තනි තිතට අයත් කස්තිරමක් / ඉරට්ටියක් / කලාසමක් ලියන්න. (ලකුණු 04)
(3) මාත්‍රා 2 + 3 දෙතිතේ තාලයට අයත් වන්නමක / සරල කවි තාලයක කවි පදයක් ප්‍රස්තාර කරන්න. (ලකුණු 04)

(04) (1) දේශීය වාද්‍ය භාණ්ඩ හයක් නම් කරන්න. (ලකුණු 03)
(2) දේශීය වාද්‍ය භාණ්ඩ සැකසීම සඳහා යොදාගන්නා අමුද්‍රව්‍ය තුනක් ලියන්න. (ලකුණු 03)
(3) දේශීය වාද්‍ය භාණ්ඩ වාදනයට ගන්නා අවස්ථා තුනක් නම් කර, ඉන් එකක් විස්තර කරන්න. (ලකුණු 04)